## සිකුරාදා

පළමුවන කියැවීම 1 මකබ් 4: 36–37, 52–59

**"තලා හඬවා, වීණා වයා, අත්තල් ගසා, කැප කරන ලද පූජාසනය මත ඔව්හු පඬුරක් ඔප්පු කළහ."**

ජුදාස් සහ ඔහුගේ සහෝදරයෝ කථා කොට, "දැන් ඉතින් අපේ සතුරන් පරාජය කරනු ලැබූ බැවින් අපි ශුද්ධ ස්ථානයට ගොස් එය කැප කරමු"යි කිවෝ ය. එබැවින් මුළු සේනාව සංවිධානය කොට සියොන් කන්දට ගියෝ ය.

වර්ෂ එකසිය හතළිස් අටේ කිස්ලෙව් යන නව වන මාසයේ විසි පස් වන දින ඔව්හු අලුයම නැගිට තමන් සෑදූ අලුත් යාග පූජාසනය මත නීතිගත පූජා පඬුරක් ඔප්පු කළහ. තලා හඬවා, වීණා වයා, අත්තල් ගසා, පූජාසනය කැප කරන ලදි. ඊට කලින් විජාතිකයන් පූජාසනය කෙලෙසූ වසරේ එම කාලයෙහි ම, එම දවසේ ම කැප කරන ලදි. මුළු සෙනඟ නමස්කාර කරමින් මුණින්තලා වැටී ඔවුන්ට ඒ සා මහත් ජයග්‍රහණයක් දුන් දෙවියන් වහන්සේට ඉමහත් ලෙස ප්‍රශංසා කළහ. ප්‍රීතියෙන් ප්‍රමෝද වී දවන යාග පූජා ද ඔප්පු කරමින්, ඔව්හු දවස් අටක් ම පූජාසනය කැප කිරීමේ උත්සවය පැවැත්වූහ. ඔව්හු මාලිගාවේ ඉදිරිපස රන්මය ඔටුණු හා තෙරා ගිය කැටයම්වලින් සරසා, දොරටු සහ ගබඩා කාමර අළුත්වැඩියා කොට ඒවාට දොරවල් සවි කළහ. ජනයා අතර ප්‍රීති ප්‍රමෝදය නිම් හිම් නැති විය. මෙලෙස ඔව්හු විජාතිකයන් නිසා සිදු වී තිබුණු අපකීර්තිය නැති කළහ. තවද, ජුදාස් සහ ඔහුගේ සහෝදරයෝ ද ඉශ්රායෙල්වරුන්ගේ මුළු සභාව ද, වසරක් පාසා නියමිත කාලයේ දී, එනම්, කිස්ලෙව් මාසයේ විසිපස් වන දින පටන් දවස් අටක් ම ප්‍රීති සන්තෝෂයෙන් පූජාසනය කැප කිරීමේ උත්සවය පැවැත්විය යුතු බවට නීතියක් පැනවූහ.

දේව වචනය මෙසේ ය.

| පිළිතුරු ගීය |
|---|

1 වංශාවලිය 29 : 10–12

පිළිතුර: සමිඳුනි, අපි ඔබගේ තේජවත් නාමය වර්ණනා කරමු.

ගීය:

"අපේ පිය වන ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්ස, ඔබට සදහට ම ප්‍රශංසා වේවා.

සමිඳාණන් වහන්ස, ශ්‍රේෂ්ඨත්වය ද බලපරාක්‍රමය ද තේජස ද වික්‍රමය ද මහිමය ද අයත් ඔබට ය. මන්ද, ස්වර්ගයෙහිත්, පොළොවෙහිත් ඇති සියල්ල ඔබේ ය.
සමිඳාණන් වහන්ස, රාජ්‍යයත් ඔබට අයිති ය. ඔබ සියල්ල කෙරෙහි විශිෂ්ඨ ලෙස උසස් ව සිටින සේක.

වස්තුව ද ගෞරවය ද පැමිණෙන්නේ ඔබෙන් ය. ඔබ සියල්ල පාලනය කරන සේක. බලය ද පරාක්‍රමය ද ඔබ අතෙහි ය.
සියල්ලන් උසස් කරන්නටත්, ශක්තිමත් කරන්නටත් බලය තිබෙන්නේ ඔබ අතෙහි ය.

සුපුවත් ජය නද (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
"අපේ මිදුම්කාරයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මරණයේ බලය බිඳ දමා ජීවනයත් අමරණීය භාවයත් ගැන සුබ අස්න මගින් හෙළි කර වදාළ සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි. ඔව්හු ද මා පසුපස්සේ එති"යි ස්වාමින් වහන්සේ වදාරන සේක.
ආලේලූයා!

සුවිශේෂය

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

ලූක් 19: 45-48

**"ඔබ ස්වාමින් වහන්සේගේ ගෘහය සොරුන්ගේ ගුහාවක් කර තිබේ."**

ජේසුස් වහන්සේ දේව මාලිගයට ඇතුළ් වී එහි සිටි වෙළෙඳුන් පළවා හරින්නට පටන් ගෙන "මාගේ ගෘහය යාච්ඤාවේ ගෘහයක් වන්නේ ය යි ලියා ඇත. එහෙත් ඔබ එය සොරුන්ගේ ගුහාවක් කර තිබේ ය"යි ඔවුන්ට වදාළ සේක.

උන්වහන්සේ දිනපතා දේව මාලිගාවෙහි ඉගැන්වූ සේක. එහෙත් නායක පූජකයෝ ද විනයධරයෝ ද ප්‍රභූවරුන් ද උන්වහන්සේ නසාලීමට උපක්‍රම සෙවූහ. මුළු ජනතාව උන්වහන්සේගේ ඉගැන්වීම්වලට සතුටින් සවන් දුන් බැවින්, උන්වහන්සේට කිසිවක් කිරීමට ඔවුන්ට ඉඩක් නොලැබිණි.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.